ගම්පහ අධ්‍යාපන කලාපය
Gampaha Education Zone

දෙවන වාර ඇගයීම - 2025
Second Term Evaluation - 2025

| | | |
|---|---|---|
| ශ්‍රේණිය Grade: 07 | විෂයය Subject: බුද්ධ ධර්මය | කාලය Time: පැය 02 |

I කොටස

1 සිට 20 දක්වා සියලු ප්‍රශ්න වලට නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

01. බුදුරජාණන් වහන්සේ තමා හමුවට පැමිණි හුහුංක ජාතික බමුණෙකුට සැබෑ බමුණෙකුගේ ලක්ෂණ කියා දුන්නේ සත් සතියේ,

I. පස්වන සතියේ දී ය. II. තුන්වන සතියේ දී ය.
III. හයවන සතියේ දී ය. IV. හතරවන සතියේ දී ය.

02. ඔබේ ශාස්තෘවරයා කවරෙක්ද? ඔබ රුචි කරන ධර්මය කුමක්ද? ඔබ අනන්ත ජිනද?.... ආදි ප්‍රශ්න බුදුරදුන්ගෙන් විමසනු ලැබුවේ..

I. බරණැස සිටුතුමා ය. II. යසකුල පුත්‍රයා ය.
III. භද්දවග්ගිය කුමාරවරු ය. IV. උපක ආජීවකයා ය.

03. තම පලමු ධර්ම දේශනය දේශනා කිරීමට සුදුස්සන් කවුදැයි විමසා බැලීමේදී බුදුරජාණන් වහන්සේට සිහිපත් වූ ගුරුවරයෙකි.

I. අසිත තවුසා II. උද්දකරාමපුත්ත තවුසා
III. භද්දිය තවුසා IV. කාලදේවල තවුසා

04. තෙරුවන් සරණ ගිය පළමු උපාසකයා වූයේ

I. බිම්බිසාර රජතුමා ය II. යසකුල පුත්‍රයා ය
III. බරණැස සිටුතුමා ය. IV. අනේ පිඬුසිටුතුමා ය.

05. බුදුරජාණන් වහන්සේගේ ප්‍රථම ධර්මදූත කණ්ඩායමට අයත් වූ භික්ෂූන් වහන්සේලා ගණනින්,

I. හැටකි II. පනස් පහකි
III. හැට දෙකකි IV. පනහකි

06. බුදු කරුණාව ලැබූ අසරණ වූ කාන්තාවකි.

I. ඛේමා II. යසෝදරා

III. රජ්ජුමාලා IV. අම්බපාලි

07. බුදුරජාණන්වහන්සේ චතුරාර්ය සත්‍ය තමන් වහන්සේම අවබෝධ කරගෙන අන්‍යයන්ටද කරුණාවෙන් යුතුව අවබෝධ කරවීම නිසා

I. බුද්ධ නම් වන සේක II. අරහං නම් වන සේක

III. සුගත නම් වන සේක IV. ලෝක විදූ නම් වන සේක

08. ලෞකික ලෝකෝත්තර සැප ලැබීමට හේතුවන භාග්‍ය හෙවත් කුසල් ඇති නිසාත්, රාග, මෝහ ආදී කෙලෙස් මුල් සිඳබිඳ ඇති නිසාත් බුදුරජාණන් වහන්සේ "භගවා" යන නමින් හඳුන්වා ඇත්තේ,

I. විශුද්ධි මාර්ගයේ ය. II. බුදුගුණා ලංකාරයේ ය.

III. කාව්‍යශේඛරයේ ය. IV. සිරිත් මල්දමෙහි ය.

09. 'සිරිත් මල්දම' නම් ග්‍රන්ථයෙහි කතුවරයා වන්නේ,

I. ඇම්.ඇල්. සිල්වා ගුරු මුහුන්දිරම් තුමාය.

II. තොටගමුවේ ශ්‍රී රාහුල හිමි ය.

III. වීදාගම මෛත්‍රී හිමි ය.

IV. අලගියවන්න මුකවෙටිතුමා ය.

10. සියලු ලෝ සතට මෙත් වැඩිය යුතු ආකාරය පිළිබඳව පහදා දී ඇති සූත්‍ර දේශනාව වන්නේ,

I. දම්සක් පැවතුම් සූත්‍රය II. සිගාලෝවාද සූත්‍රය

III. රතන සූත්‍රය IV. කරණීය මෙත්ත සූත්‍රය

11. ආනන්ද හිමියන්ගේ මග පෙන්වීම මත 'ආනන්ද බෝධිය" රෝපණය කරවීම සඳහා මුල් වී ක්‍රියා කරන ලද්දේ,

I. පූර්ණවර්ධන සිටුතුමා ය. II. අනේපිඬු සිටුතුමා ය.

III. මිගාර සිටුතුමා ය. IV. ධනංජය සිටුතුමා ය.

12. ධම්ම පදයේ ඇතුලත් ගාථා ගණන,

I. හාරසිය විස්සකි II. විසි හයකි.

III. හාරසිය විසිතුනකි IV. දෙසිය අනූනවයකි.

13. පංචශීල ප්‍රතිපදාවට අනුව නොකළ යුතු දේ නොකර සිටීම

I. අකුසලයයි II. සමාදානයයි

III. විරතියයි IV. කුසලයයි

14. මිච්ඡා ආජීවය යනු

I. වැරදි දිවි පෙවෙතයි II. නිවැරදි දිවි පෙවෙතයි

III. වැඩදායි දිවි පෙවෙතයි IV. අලස දිවි පෙවෙතයි

15. අපණ්ණක ජාතකයෙහි අනුවණ සාත්තු නායකයා වශයෙන් ඉපිද බුද්ධ කාලයේ දී තමා විසින්ම විනාශයට පත් වූයේ,

I. ඡන්න හිමිය II. ථුල්ලතිස්ස හිමිය

III. දෙව්දත් හිමිය IV. සුභද්‍ර හිමිය

16. ඉවසීමේ ගුණය මනාව ප්‍රකට කල බුද්ධකාලීන මහරහතන් වහන්සේ නමකි.

I. සැරියුත් මහරහතන් වහන්සේ II. මුගලන් මහරහතන් වහන්සේ

III. මහා කාශ්‍යප මහරහතන් වහන්සේ IV. අස්සජි මහරහතන් වහන්සේ

17. 'ඉවසීම" මංගල කරුණක් ලෙසට සඳහන් වන සූත්‍ර දේශනාව වන්නේ,

I. තිරෝකුඩ්ඩ සූත්‍රය II. මහා මංගල සූත්‍රය

III. සිගාලෝවාද සූත්‍රය IV. මහා සමය සූත්‍රය

18. "අක්කියාල" යනු

I. පන්සලට පූජා කරන කොටසයි II. දෙවියන්ට පුදන කොටසයි

III. සතුන්ට වෙන් කරන කොටසයි IV. වී වගා කරන කොටසයි

19. ඥාතීන්ට කළගුණ සැලකීම සඳහා ධර්ම ප්‍රචාරක කටයුතු වලට තම ජන්ම භූමිය තෝරාගත් තෙරුන් වහන්සේ වන්නේ,

I. පුණ්ණ තෙරුන් ය. II. මුගලන් තෙරුන් ය.

III. ආනන්ද තෙරුන් ය. IV. යස තෙරුන් ය.

20. උපයන ධනය සමාජ යහපතට හේතුවන අයුරින් වැයකළ යුතු ආකාරය පිළිබඳව පහදා දෙන සූත්‍ර දේශනාව වන්නේ,

I. පරාභව සූත්‍රයයි
II. අණණ සූත්‍රයයි
III. අනත්ත ලක්ඛන සූත්‍රයයි
IV. පත්තකම්ම සූත්‍රයයි

(ලකුණු 20x2=40)

බුද්ධ ධර්මය - 7 ශ්‍රේණිය

II කොටස

පළමු ප්‍රශ්නය ඇතුළු ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.

01. I. දෙවන වාරයට නියමිත ඇගයීම සිදු කළ පාඩම නම් කරන්න.

II. එහිදී ඇගයීම කළ ඇගයීම් ප්‍රභේදය නම් කරන්න.

III. මෙම ඇගයීම සිදු කිරීම සඳහා ගුරුතුමියගෙන් ලැබුණු උපදෙස් දෙකක් ලියන්න.

IV. භූමිකා රංගනයට අදාලව ඔබ යොදාගත් චරිත දෙකක් ලියන්න.

V. මෙම ඇගයීම තුලින් ඔබ ඇති කරගත් යහපත් ගුණාංග දෙකක් ලියන්න.

VI. මෙම පාඩමට පාදක වූ ජාතක කතාව කුමක්ද?

VII. හොඳ නායකයෙකු තුල තිබිය යුතු ගුණාංග දෙකක් ලියන්න.

VIII. ඔබට පාසලේ දී නායකත්වය දැරීමට සිදුවන අවස්ථා හතරක් ලියන්න.

IX. අදූරදර්ශි නායකත්වය නිසා ඇතිවිය හැකි අයහපත් ප්‍රතිඵල දෙකක් ලියන්න.

X. සාත්තු නායකයෙකු යනුවෙන් හැඳින්වෙන්නේ කවරෙක්ද?

(ලකුණු 2x10=20)

02. I. තුන් සූත්‍රයට අයත් සූත්‍ර දේශනා අතරින් දෙකක් ලියන්න. (ලකුණු 2)

II. මෙත් වඩන්නෙකු තුල තිබිය යුතු ගුණාංග තුනක් නම් කරන්න. (ලකුණු 3)

III. මෛත්‍රී භාවනාව වඩන ආකාරය කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 5)

03. I. බුදු සසුනේ අග්‍රදායිකාව විසින් තනවා බුදු සසුනට පූජා කළ ආරාමය කුමක්ද?

(ලකුණු 2)

II. විශාඛාවගෙන් ඇසූ පැනයට පිළිතුරු ලෙසට ඇය දුන් පිළිතුරෙහි සඳහන් වූ මහමග දිවයාම අශෝභන වන පුද්ගලයින් හතර දෙනාගෙන් තිදෙනෙක් නම් කරන්න.

(ලකුණු 3)

III. විශාඛා උපාසිකාවගේ චරිතයෙන් ගත හැකි ආදර්ශ පහක් ලියන්න. (ලකුණු 5)

04. I. වෛරය සංසිඳෙන අයුරු දක්වමින් 7 ශ්‍රේණිය බුද්ධ ධර්මය පෙළ පොතෙහි සඳහන් වන ධම්ම පද ගාථාව ලියන්න. (ලකුණු 2)

II. එම ගාථාවේ තේරුම ලියන්න. (ලකුණු 3)

III. මෛත්‍රී සහගතව කටයුතු කිරීමෙන් සැලසෙන වාසි පහක් ලියන්න. (ලකුණු 5)

05. I. නිරෝගී සෞඛ්‍ය සම්පන්න ජීවිතයක් ගත කිරීම සඳහා අප සමාදන් විය යුතු පංචශීලයෙහි ඇතුලත් ශික්ෂා පද දෙක ලියන්න. (ලකුණු 2)

II. වාචසික අකුසල් තුනක් නම් කරන්න (ලකුණු 3)

III. පන්සිල් සුරැකීමෙන් සිදුවන යහපත පිළිබඳව කෙටියෙන් පහදන්න (ලකුණු 5)

06. I. අග්‍ර ශෂා දානය යනු කුමක්ද? (ලකුණු 2)

II. බුදුරජාණන් වහන්සේ කළගුණ සැලකීමේ අගය ලෝකයාට ප්‍රකට කළ අවස්ථා තුනක් ලියන්න. (ලකුණු 3)

III. දිවිසරු කර ගැනීම සඳහා අපේ පැරණි ජන සමාජයෙන් අපට උරුම වූ චාරිත්‍ර පහක් ලියන්න. (ලකුණු 5)

07. පහත සඳහන් මාතෘකා අතරින් දෙකකට කෙටි සටහන් ලියන්න.

I. ගුරු සිසු යුතුකම්

II. වෘද්ධාපචායනය

III. පන්සලේ දී අනුගමනය කළ යුතු සිරිත්

IV. බිම්බිසාර රජතුමා (5x2=10)